*Archaeologia (2004) : 56 - 67*

# බ්‍රිතාන්‍ය යටත් විජිත මූල්‍ය ක්‍රමය තුළ ශ්‍රී ලංකාවේ භාවිත වූ කාසි සහ එහි අන්තර්ගතය

**රේෂාණි ධර්මවර්ධන**
පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
e-mail : rdharmawardene@yahoo.com

## හැඳින්වීම

ශ්‍රී ලංකාව සම්පූර්ණයෙන්ම බ්‍රිතාන්‍ය යටත් විජිතයක් බවට පත් වූයේ 1815 දී වුවත් මෙරට බ්‍රිතාන්‍ය පාලනය ආරම්භ වූයේ 1976 පෙබ. 16 වන දින ෆන් එංගල්බෙක් ලන්දේසි ආණ්ඩුකාරයා විසින් ලන්දේසීන් සතුව පැවති සියලුම මුහුදුබඩ ප්‍රදේශ ඉංග්‍රීසි පෙරදිග ඉන්දියා වෙළඳ සමාගමට පවරා දෙමින් ගිවිසුමකට අත්සන් තැබීමත් සමඟිනි. එතැන් පටන් 1948 දී බ්‍රිතාන්‍ය ආධිපත්‍යයෙන් මිදී ශ්‍රී ලංකාව නැවතත් ස්වෛරී රාජ්‍යයක් බවට පත්වනතුරු මෙරට ක්‍රියාත්මක වූ මූල්‍ය ක්‍රමය තුළ බ්‍රිතාන්‍යයන් විසින් සංසරණයේ යොදවා තිබූ කාසිවල අන්තර්ගත සලකුණු ඇසුරින් මෙරට ආර්ථිකය තුළ බ්‍රිතාන්‍ය ආධිපත්‍යය ක්‍රමයෙන් වර්ධනය වීම, ස්ථාවරත්වයට පත් වීම සහ පරිහානිය පිළිබිඹු කරන ආකාරය විමර්ශනය කිරීම මෙම ලිපියේ අරමුණයි. එම කාසි සංසරණයේ පැවති කාලසීමාව අනුව ප්‍රධාන කාල පරිච්ඡේද 4 කට ඒවා අනුගත කළ හැකිය.

1. 1796 සිට 1825 දක්වා භාවිත වූ කාසි
2. 1825 සිට 1869 දක්වා භාවිත වූ කාසි
3. 1869 සිට 1872 දක්වා භාවිත වූ කාසි
4. 1872 සිට 1948 දක්වා භාවිත වූ කාසි

## 1796 සිට 1825 දක්වා භාවිත වූ කාසි

බ්‍රිතාන්‍යයන් විසින් ලන්දේසීන් නෙරපා හැර ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ අත්පත්කර ගැනීමෙන් පසුව මෙරට ආර්ථික ගණුදෙනුවල දී ලන්දේසීන් භාවිත කළ මූල්‍ය ක්‍රමයම අනුගමනය කරන ලදී (Codrington 1924, 145). ලන්දේසීන් විසින් ද සිය මූල්‍ය ඒකකවලට අමතරව පෘතුගීසි මූල්‍ය ඒකක භාවිත කර තිබේ. මේ නිසා ප්‍රථමයෙන්ම පෘතුගීසි හා ලන්දේසි පාලන අවධි තුළ භාවිත මුදල් පිළිබඳ කෙටි හැඳින්වීමක් කිරීම යෝග්‍ය වේ.